අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/60/01/වා.ස්.මා - 2024
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2023.11. 30

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු,
සියලුම ජාතික පාසල් විදුහල්පතිවරු,

**ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ (ජාතික පාසල්) නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය - 2024**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධරයන් ( ජාතික පාසල්) සඳහා වන 2024 වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය මේ සමඟ එවමි. එය http:/www/moe.gov.lk වෙබ් අඩවියේ ද පළකර ඇත.

02. එම ස්ථාන මාරු පරිපාටිය අනුව ජාතික පාසල්හි සේවය කරන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ශ්‍රේණිධාරීන් දැනුවත් කර අයදුම්පත් කැඳවා පහත පරිදි ලේඛන සකස් කර 2023.12.31 දිනට හෝ ඊට පෙර අප වෙත එවීමට කටයුතු කළ යුතුය.

i. ජාතික පාසල්වල සේවය කරනු ලබන ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන නිලධාරීන්ගේ අයදුම්පත්‍රය ආකෘති පත්‍ර වි.සේ./වා.ස්.මා./ජා.පා (01) මඟින් අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.
ii. ඉහත පරිදි ලැබෙන සියලුම ස්ථාන මාරු අයදුම්පත් ආකෘති පත්‍ර වි.සේ./වා.ස්.මා./ජා.පා (02) ආකෘතිය අනුව උප ලේඛනගත කර අදාළ පාසලේ විදුහල්පති විසින් කලාප අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යක්ෂ මඟින් ඉදිරිපත් කළ යුතුය.
iii. එක් සේවා ස්ථානයක අවු. 06 කට වැඩි කාලයක් ජාතික පාසල්වල සේවය කර ඇති සියලුම නිලධාරීන්ගේ තොරතුරු ආකෘති පත්‍ර වි.සේ./වා.ස්.මා./ජා.පා (03) අනුව උප ලේඛනගත කර අදාළ පාසලේ විදුහල්පති විසින් කලාප අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යක්ෂ මඟින් ඉදිරිපත් කළ යුතුය.

03. මෙම සියලු අයදුම්පත් සහ ආකෘති පත්‍ර පළාත් අධ්‍යක්ෂ විසින් 2023.12.31 දිනට ප්‍රථම පහත ලිපිනයට එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව අවධාරණය කරමි.

සහකාර ලේකම් (විදුහල්පති ශාඛාව)
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත්:

01. සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරු - කරු. දැ.ගැ.ස



CamScanner

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/04/60/01/වා.ස්.මා - 2024
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2023.11. 30

පළාත් අධ්‍යාපන ලේකම්,

..........................................................................

**ජාතික පාසල් සහ පළාත් පාසල් අතර ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් - 2024**

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛ අංක 43/2023 අනුව 2024 වර්ෂය සඳහා ජාතික පාසල් අතර, ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I / II / III නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් සිදු කිරීමට නියමිත අතර, ඊට සමගාමීව පළාත් පාසල්වල සිට ජාතික පාසල්වලට ස්ථාන මාරුවීම් ඉල්ලුම් කරනු ලබන ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් ඔබ පළාතේ සිටී නම් ඒ සඳහා අවස්ථාව ලබාදීමට මේ සමග එවනු ලබන වි.සේ/වා.ස්.මා/පළාත්(01) හි සඳහන් ආකෘතිය අනුව අයදුම්පත් සම්පූර්ණ කර එවන ලෙස ඔබ පළාතේ සිටින ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි. වාර්ෂික ස්ථාන මාරු චක්‍රලේඛය http:/www/moe.gov.lk වෙබ් අඩවියේ ද පළකර ඇත.

02. එසේ ලැබෙන අයදුම්පත් මේ සමග අමුණා ඇති වි.සේ/වා.ස්.මා/පළාත්**(02)** හා වි.සේ/වා.ස්.මා/පළාත් **(03)** යන ආකෘති අනුව වගුගත කර එම සියලු තොරතුරු 2023.12.31 දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට ලැබෙන සේ **ඔබගේ නිර්දේශ හා පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ගේ නිර්දේශ සහිතව** එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි. එම දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරන බවද කාරුණිකව දන්වමි.

සහකාර ලේකම් (විදුහල්පති ශාඛාව)
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල.

එම්.එන්.රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත් -

01. සියලුම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්වරුන් - කරු. අදාල තොරතුරු නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා
02. සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් - කරු. අදාල තොරතුරු නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා
03. සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් - කරු. අදාල තොරතුරු නියමිත දිනට ඉදිරිපත් කිරීම සඳහා

ගරු අමාත්‍යතුමා / கௌரவ அமைச்சர் / Hon. Minister
+94112784832
+94112784825
minister.education@moe.gov.lk

ලේකම් / செயலாளர் / Secretary
+94112784811
+94112785162
secretary.education@moe.gov.lk

CamScanner